රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2024.10.19**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**
**වෙබ් අඩවි කර්තෘ**

**<u>හිටපු ජනාධිපතිවරුන්ට නිල වශයෙන් හිමි කිසිවක් අහිමිකර නැහැ</u>**

"මහින්දට දුන් වාහන 03ක් ආපසු ගනී" යනුවෙන් අද (19) පළවූ මාධ්‍ය වාර්තා සම්බන්ධව පහත පැහැදිලි කිරීම යොමු කරමි.

1986 පෙබරවාරි මස 18 දින නිකුත් කරන ලද "1986 අංක 04 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත" අනුව හිටපු ජනාධිපතිවරුන් වන ගරු මහින්ද රාජපක්ෂ මහතාට සහ ගරු රනිල් වික්‍රමසිංහ මහතාට දැනට භාවිතා කරනු ලබන අතිරික්ත වාහන භාර දෙන ලෙස ලිපි මගින් දැනුම් දී ඇත.

1986 අංක 04 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනතේ 3 (2) වගන්තිය අනුව "සෑම හිටපු ජනාධිපතිවරයකුට ම සහ සෑම හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවකට, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුට තත්කාලයේ සපයනු ලබන නිල ප්‍රවාහන සහ වෙනත් සියලු පහසුකම් සලසනු ලැබිය යුතු ය". මීට අමතරව 2010 මැයි 14 දින එවක ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ අත්සනින් යුතුව අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යවන ලද ලිපියේ 3.1 වගන්තිය අනුව ද "ගරු අමාත්‍යවරුන්ගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන (මෝටර් රථ, ජීප්, ඩබල් කැබ්) සංඛ්‍යාව 03ක් වේ." ඒ අනුව අදාල කටයුතු සිදුකර ඇත.

හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මහතා භාරයේ තිබූ වාහන 16න් වාහන 08ක් දැනට භාරදී ඇති අතර, හිටපු ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා භාරයේ වාහන 11ක් මේවන විට පවතී.

එච්.එස්.කේ.ජේ.බණ්ඩාර
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු දු T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk